# පහත රට කෝලම් නැටුම්

තංගල්ලේ ඇස්. එච්. සව්රිස් සිල්වා

රටේ අතීත ජන ප්‍රවාදය සමඟ එන පුරාවෘතයන් කීපයයෙක රක්ෂා ස්ථානය ලෙස ගත හැකිය පහතරට නැටුම් තුළ එන කෝලම් නැටුම.

ජාතිය සමග එමින් එහි විත්තීන් රැඳුණු මේ කෝලම් කවරදක, කවුරුන් නිසා කුමකට ආදි යෙන්ම බිහි වී දැයි සෙවුම කෝලමෙහි එන අර්ථය සපුරා දැනගන්නට හැකි වන මාවතය.

පෙණෙන තරමේ ඇතින් ඇවිස්සුව, කෝලම් උපත ලැබෙන්නේ ''වාහ'' නම් වූ නිරිඳු සමයෙහි කෝලම් උපතෙහි එන පරිදි ''වාහ'' රජුගේ බිසවට ගැබ් ඇත්තී දෙලක් උපන. කෙළි සිනා නැටුම් දකිනු රිසි වූ ඈ ඒ බව රජුට කීවාය. රජු දෙල සන්සිඳවනුව, නැටුම් ගැයුම් වැයුම් ඈ විවිධ ව කර වූය. එය බිසව සිත්නොගත්තී ඒවා අපිරි කළාය. ඒ බව කෝලම් උපතෙහි කියවෙනුයේ මෙසේය.

| | | |
|---|---|---|
| ව සී | රටින් රට සිට විත් අපි | රි |
| නිසී | මලක්කම් දමමින් බහු | රි |
| ර සී | ගණන් අල්ලා මිණි ගිගි | රි |
| සි සී | කියා එබිසව විය අපි | රි |

දෙල සන්සිඳුවනුව කළ මෙතෙක් දෙයින් පිහිටක් නැත්තේ ''මෙහි ලා කුම්කරමු'' දැයි රජු ඇමතින් පිළිවිත. ඇමති බස් ගෙන රජු කෝලම් නැටුමක් කරවූය. බිසවගේ දෙල සන්සිඳින. මේ පුවතට සාධක දෙනකෝලම් උපතේ එන කවිය මේ.

| | | |
|---|---|---|
| ව ද | ළ බස් පිළිගෙන රජු එදි | තේ |
| ස ද | කැපූ කෝලම් නොව පම | ණේ |
| න ද | සිතින් රහ දුක් වූ සදි | තේ |
| එ ද | බිසව දෙල දුක සන් සිඳු | තේ |

| | | |
|---|---|---|
| වඩු | දන නොපමණ කැඳවා එතන | ට |
| ද ඩු | කජ්පා පලවාදී ඔහු හ | ට |
| අඩු | නොව පිතිරුව නිසි රිසි විලස | ට |
| ද ඩු | රුව කෝලම් කැප්වූ එමවි | ට |

ආදිම කෝලම් නැටුම මෙයයි ගත් විට කෝලම ආදියෙන් ම, දඩු රුකපා ඉන් කළ බව පළවේ. රුකඩයෙන් උපන් මේ කෝලම, එ ද ජනයා අතර පිළිගැනී එය රුකඩ නොව, මිනිසුන් නටන කලාවක් කරන්නට යුතුයැයි සම්මත විය. එසේ ලත් දියුණුව යටතේ මනමේ ,සඳකිඳුරු ඈ ඉපැරණි කෝලම් බිහිවිය.

කෝලම් බවට පැමිණ එසේ නොනැසෙන අගයක වූයේ, එ ද සමාජය තුළ කැපී පෙණුන, මිනිසාගේ විශෙෂතාය. එම විශෙෂ තා අතරේ ලා සලකන කල මුදලිවරයා රජයෙන් ලත් බහු බල යටතේ, එදත් මහ විශෙෂයෙකි. කොතෙක් විශෙෂ ද කිව, ඔහු හිරු දෙවිමෙන් මහා තේජවත් විය. මිනිසෙකු නොව දෙවියෙකු බඳුව ගරු සරු වූ මොහු ,ඇතැමුන් ඇමතුවේ, ''මුදියන්සේ'' යන්නට ම ''හාමුදුරුවෝ'' යනුද එක් කරමිනි.

මේ බලගතුවේ විශෙෂ විශිෂ්ට බව දුටු එකල අය කෝලම තුළට වී, මුදලි තේජාව, හරියට මවා

පෙන්වීමේ මහ ආයාසයක විය. සාර්ථක වූ එ ම ආයාසයේ ඉෂ්ට ප්‍රතිඵලය ය මුදලි කෝලමේ වූ නැටුම. එ ම කෝලමා එන විට, කියන මේ කව අතරින් ඔහුගේ නැටුම් සැරසුම කෙබඳු දැයි නිශ්චයේ දැකිය හැකිය.

ගිරි සාද මෙ සිරි කගය උර දර මී න්තේ
මැති දුන් ගේ සිරයට ගැසූ පනාව දිලියෙ න්තේ
මැති දුගෙ ගත පලඳින ඒ කබාය දිලියෙ න්තේ
මැති මුව පිරි මැද මැද ලෙන්සුව කර ල න්තේ

කෝලම් නැටුමෙහි කෂ්ටයන් තුළවුව අද නැති, මෙ ම මුදලි කෝලම මෙන් ම, නෂ්ට වූ තව විශාරද නැටුමකි. ''ලියනරාළ'' යන කෝලම. මෙ ම කෝලම නැටුම තුළ පණ ගැන් වූයේ, එ ද සමාජයෙහි ඔහු ද බොහෝ බල කාර වූ නිසා යයි සිතිය හැක.

ලියන රාළ නැටුමට, සබ බලා එන විට ගෙන එන බස්තම, ඔහු සතු එ ම විශෙෂ බලකාරබවේ මහ ලකුණය. බලය ඔහු තුළ නොව බස්තම තුළයයි කියන තරමට නැටුමේදී ඔහු බස්තම අගය කළේය. ලියනරාළ සබයට එන කල කියන කවක්ය මේ.

පනිවිඩ කරවනා ලෙසට සබයට එයි එවි ටා
සතහට වැර සැර කරමින් බස්තම ගෙන අත ටා
එම විට එයි සැරසීගන ලියනරාළ සොඳ ටා
මෙමම විලසට පැමුණුනි සබයට රජු අණ ලෙස ටා

එ ද සමාජයේ ලියන රාළ තරමට ම බලකාර බවක් ලබා සිටි කෙනෙකි ''හේවාරාළ''. ඇතැම් විට ලියනරාළටත් වඩා බලකාර බවක් වියහැක ඔහු. ඉන්නිසා හේවා බව ද එ ද කෝලම් අතරට එක් වී පණ ලැබුවේය. හේවා කෝලම තුළට වී, එ ද කෙනෙකු, හේවා ස්වරූපය සාර්ථක කළේ, හේවාගේ කාරිය හුවා දක්වන සන්නස ද කගපත ද අතෙහි දරමින්, කිසිල් ලෙහි තළපත ද දරමින්ය. මේ බව සනාථ වෙයි මේ එන කවි වලින්.

සන්නස් පතක් ගෙ න
නිරිඳුන් වදන් විලසි න
ඇවිදින් දූන් මෙ තැ න
කියයි සබ මැද නොයෙක කළම න

තලපත කිසි ල්ලේ
ඉස්පයි දූල් රොසැ ල්ලේ
පතක් ගෙන ලො ල්ලේ
දුවයි සේවකයා ඇසි ල්ලේ

කග පලහ අඩය ටි
දරා සුරතින් සැරය ටි
රහ බල එනු බුහු ටි
බලන් හේවා රාළ එන හැ ටි

අණ බෙර වැයීම ද කෝලමට එක් වූ තව කාරියකි. මෙය කෝලමට එක්වූයේ රජුගේ අණ රටතොට පැවසීමේ මහකාරිය, බාරව සිටි අණ බෙරකරු දූරු සමාජ තත්ත්වය පෙන්වමිනි. ඉදින් අණ බෙරයත් අණ බෙරකාරයාත්, සමාජය තුළ එද කැපී පෙණුන බව සාකල්‍යයෙන් ම කිව හැකිය. මේ වූ කරුණු යටතේ අණබෙර වැයුම, කෝලයකට හැරී, ''අණ බෙර කෝලම'' ය යි නම් වී ය.

අණ බෙර කෝලමේ ඇඳුම, කුලවාදය නිසා තෙරපුණු මිනිස් පෙළකගේ ඇඳුම් විලාසයට සාක්ෂි දෙන්නකි. කුල විශෙෂයක සලකුණු කියන අද කෙමෙන් ඉවත් වී යන, මේ ඉපැරණි ඇඳුම, අණ බෙරකෝලම තුළ තවම රැකේ. අණ බෙර කෝලම නොනසිනතුරුම් මේ පෞරාණික ඇඳුම ද නො නැසී පවතී. මේ සැරසුමෙහි වග, අණ බෙර කෝලමෙහි එන මේ කවි තුළ රැඳී පවතී.

කිසිල්ලට තලපතක් ගනිමින්
සැරමිටිය ගෙන අතක ටා
දවුලකුත් උරලමින් බැඳගෙන
පච්ච වඩමක් ඉනව ටා
රැවුලමත් දිගුකරනි සබයට පැමිණ
තැන තැන සිට සි ටා
වෙවුලමින් බැස නටයි සබයේ
මහලු වූ තද වයස ටා

කෝලම් අතරට තව එක් වූ විශෙෂයකි ''ආඩි කෝලම'' ආඩියා විදෙශිකයෙකි. ඉන්දියාවෙන් දිල්ලියේ සිට පැමිණි මොහු, කාගේත් ඇස දිනා ගත්තේ, ඔහුගේ ආර්ථික අඳුර තුළ වූ අඩාල ජීවිතය නිසාය. මේ ආඩි අමුත්තා එ ද කාටත් පුදුමයක් බඳු වූ අතර ඔහු ගැන කවිරුත් විපරම් වූයේ, ඔහුගේ විදෙශික වූ අමුතුම ගති පැවතුම් නිසා ම නොව, ඔහුට තව එකතු වූ, ඔහුගේ රැවුල ආදි විකටතා ද නිසාය. ආඩි කෝලමේ එන මේ කවෙන් අනාවරණය වෙයි මොහුගේ තතු.

දුරක් බෝය දිල්ලි රටේ ලස්සණ
ගුරුකියති මෙම ට
බෙරේ ගසන සද්දෙ ඇසී ආවයි
නැටුමට මෙත න ට
උරේ තිබෙන කොක්කන මේ
වියදම නැත පණ රැකුම ට
කරේ තියා උඩ පැන පැන නටමි
තැගි දුනොත් මෙමම ට

මෙ ම ආඩියාට ඇඳුම් සොයාගැනීම දුෂ්කර කාරියක් විය. ඔහු තැන් තැන් වලින් ලත් රෙදි කැබලි එල්ලා තම ඇඳුමේ සිදුරු වසා ගත්තේය එහෙයින් ඔහුගේ කලිසම තුළ එල්ලෙන විවිධ වර්ණ වූ රෙදි කැබලිය. මොහු මීස, මෙ බඳු ව අඳින අන් කිසිවෙකු මෙකල නොවූ විරුය. ඉදින් මොහු කාටත් කැපී පෙණෙන විකටයකු වුවා නිසැකය. මොහුගේ ඇඳුමේ මේ විකට බව, ආඩිකෝලමා කියන මෙ ම කාව්‍යාර්ධය අනා-වරණය කරයි.

ඉම්බෙන් රෙදි වැරලි බොහෝ ඉල්ලා
ගන යහමින්
යම් තන් එහෙකට සපයා ගෙත්තම්
කර ගනිමින්

ආඩියා මෙහි විසුවේ ලොග්ගලය. ඒ පුවත අනුමත වන ආඩිකවක් ය මේ පහත.

එක අතකින් සක යි
කොක්ක නම් පොදිය උරක යි
සක්වල වට බල යි
ලොග්ගලින් ආඩියෙක් දූන් එ යි

ලොග්ගල බහුල ජන වාසයක් වූයේ විජය රජු කල ය. එ හෙයින් ආඩියා මෙහි ආයේ විජය කල ය යි ගත් විට, ආඩි කෝලම ද එකල පටන්ම මෙහි තිබුණි යයි ගත හැකි වේ.

මෙ කී කෝලම් අතර ම ''මුක්කමා'' යන කෝලමක්ද අතීතයේ විය. කෝලම් අතරින් මුලුමනින් ම ඉවත් වූ වකි දූන් එය. මෙ ද දක්නට නැති මේ ''මුක්කමා කෝලම'', විරූපී වූ යම් අයෙකු නිසා මැවුණේ විය හැකිය. විරූපී අයෙකු වුව, සමාජයේ සැලකියැ යුතු තැනක වී නම් ඔහු අගය වන බව, මුක්කම කෝලමට එක් වීමෙන් පැහැදිලිය. මුක්කම් කෝලමා කියූ කවෙක, මෙ සේ සඳහනි, කෝලමට එක් වූ මුක්කමේ හැටි.

කිපි කප දෙහො සේ
වැදී පිනස් කා සේ
සිදී ගොස් නා සේ
සැරව ලේ කුණු නිතර වැ සේ

මහලු ඉතිරියකගේ අනුන විලාසය පළ කරමින් නටන ''ආත්තා කෝලම'' නම් වූ තව එක් නැටුමකි. මෑතක කෝලම් ගණයට එක් වූ ''නොංචි අක්කා'' ය යි තව නමකින් ද ප්‍රකට වූ මෙය ''විලාසය සාර්ථක වූ තරමට කෝලම සාර්ථකය'' යනු සැබවින් ම ඔප්පුවන තැනකි.

කහින කිඹිසින විට, සොටු දිය ඉවත ලන විට, දහඩිය හරින විට, කබ කඳුලු පිසින විට, පමණක් නොව යන ගමන, බලන බැල්ම, දමන දැත අනුවත්, මහලු බව හා ඉතිරි බව රැකගන්නා අතර, කසන කැසීම, පිසින පිසීම, හැරෙන හැරීම, දළ බවෙන් තොර වූ, ශාන්ත මහලු සුකුමාල බවකය මේ නැටුමේ. හතිය ඉවසන සැටි දක්වන විට පවා මහලු බවකය ආත්තා කෝලම.

මහලු ස්වරූපය නියි ලෙස රැකෙන පරිදි, බඳනා ලද මුහුණ ඇතිව, එල්ලෙන තන ඇතිව, නැමුණු කය ඇතිව, වයස පළ කරන රෙද්ද හා හැට්ටය ඇතිව නියම ඉරියව් පළ කරන සේ නැටුමෙන්, ආත්තා කෝලම ඉමහත්සේ ම පණ ලබයි.

මහදනා කෝලම්වලට ඇදීබැදී, ව්‍යාප්තිය කරා යෑම එ කල කොපමණද යනු විසඳුනු විට, කැපී පෙණුන සමාජයෙන් පමණක් නොව, ශාන්ති නැටුම් තුළ වූ දකුම් කලු ඇතැම් නැටුම් ද යාකර, ගැන්මෙන් ද කෝලමේ වග විශාල කර ගත්හයි දකිය හැකිය. ''ගරා කෝලම'' මේ වග මැනවින් කියාපාන, ඉතා සරු නිදසුනකි.

සිරසෙක බැඳි මිණිමකුට ඇතිව, නළලෙහි දිලෙන නා පෙණ තුනෙක් ද, ගොපලු නෙත් යුවලින්ද, රත් පැහැ දෙතොලගින් මතු වූ දිගු දළ යුවලින්ද විකටව සබයට එන ගරුවා කාගේ වුව මවිතය අවුස්සන්නෙකි. භයත්, විනෝදයත් විමතියත්, එක් විට දෙමින් සබයට ගරුවා එන්නේ මෙසේ යයි මේ කව කියයි.

ඇස් දෙක් කරක වා
සව් සත බීත කර වා
අඬ හැර ගුගුරු වා
ඇවිත් සබයට පැනපි ගර වා

රකුසු පෙළෝ වුව, කෝලමට එක් වූ, ''නාග-කන්‍යා'' යන නැටුමක් ද ආදියෙහි වූයේය. මේ නැටුම කෝලම් ගණය තුළ, එ ද අය රඳවා ගත්තේ කෝලම් නැටුම් අතරලා දකින විට ද, පෙළෝ යන රහබර, විශෙෂ බවක් එහි දුටු නිසා විය හැක.

නාගකන්‍යාව නැටුමට එන විට කියන මේ කව්, එම කන්‍යාව ගැන හා එම නැටුමෙහි ඇඳුම් ගැන විස්තර පළකරයි.

නා ලොව උප න්නේ
උරඟුන් සිරස ග න්නේ
නටනා ලෙසි න්නේ
බූම නා රජ සබේ එ න්නේ

අඳිමින් ඉතා හැඩ ක්
දරමින් දෙපුර වරල ක්
නො වී කිසි අලස ක්
ඒය මෙතනට වලා විගස ක්

කරනා විය නි ය්යා
දස දෙස බලයි ග ය්යා
නටනා ලෙස නි ය්යා
පැනපි නාගා මහ රකු ය්යා

කෝලම් නැටුම පලල් කිරීමේ ආයාසය, එ ද පල වූයේ මෙකී අය යතු විශේෂ තා අතරින් පමණක් නොවේ. පක්ෂි ලෝකය ද එ ද අය දුටුවෝ ගුරුළු රාජයාගේ ගමන බිමන, හැඩ තිම හා සමත් කම ද කෝලමට නැගූහ.

පක්ෂි ලෝකය ද කලාවේ ඇසින් දුටු ඔවුහු, එ ද එ සේ ගුරු පග කෝලමට එක් කළෝ මෙන් ම, සිවුපා ලෝකය දෙස බැලූවාහු, සිවුපා රාජවූ සිංහයා ද කෝලමට යා කර ගත්තේය.

සිංහ ඇඳුම තුළට වී, සිංහස්වරයෙන්, සිංහාභිමානයෙන්, ඔද තෙද ඇතිව, සිංහ බව ම ලගන් වමින් එ ද කෙනෙක් නැගී අයුරු සිංහ නැටුමේ එන මේ කව් පල කරයි.

නිති න් කට අයමි න
ඇ තුන් හැම මොල බුදිමි න
''කේ න් ගුඳ ගද'' ය න
න ට න් සිහ රද සබෙ ඇවිදි න

කෙසර සිහ නදින් තද කර
සිටින මන අකා සේ
නි තර ගජ කුඹුන් මොල් කැටි
බුදින අඳහ සේ
ස ස ර යන නමුත් තණ අකාල
නුබුදිනා ලෙ සේ
කෙසර සිහ රජෙක් පැන පැන
නටයි සබමෙ සේ

පෙර ''උසීරන'' නම් රජ කෙනෙක් වෙණදහම පිණිස රටවටා යනුවට, කෙනෙකුට ගොනෙකු දුනි. ඒ ගොනුගේ විශේෂය දුටු ඇත්තෝ, ගොන් නැටුමක් එ ද තැනූහ. මෙය ද එ ද කෝලම් පෙළෙහි වූයේ සැමගේම ගත සිත ඒ හා බැඳී ගියේය. ගොන් කෝලම අද දක්නට නැත ද, සබයට කෝලම ආ සැටි මේ කවෙන් කියවෙයි.

රජ පණත විලස ට
පටවා නොයෙක් ලට ප ට
යන ලෙස දන් සල ට
ගොනෙක් ගෙන එති මෙ රහ පෙළට

මේ ගොනු පෙණුමෙන් ඉතා කදිම වූවෙකි. කෝලමකට තරම් විශේෂ වූයේ, රාජකීය බව පමණක් නොව උගේ දේහයෙහි වූ විශේෂ හැඩ රුව බව මේ කවෙන් පැහැදිලි වෙයි.

නළල ලප පිහි ටි
අං දෙක නො වී ගැහැ ටි
ඉතා හුරු බුහු ටි
ගොනා කදිම යි ගමන එන හැ ටි

ගොන් නැටුමට යා වී ''කොටි නැටුමක්'' ක් ද කෝලම් ගණයට එ ද බිහිවූයේ මේ ගොනුට කොටියා පැනී මෙන් වූ හදිය නිසාය. ගොනා මෙන් ම කොටියා ද බඳෙහි වූ හැඩ රුවින් යුක්ත විය. කොටි නැටුමේ රහ විස්තර කරන කව් දෙකක් මේ ය.

නිය අවි මුන ලෙ සේ
දිගු දළ විදුරු පෙල සේ
බල කෙයරිඳු ලෙ සේ
සිරුර සිතියම් කරපු විල සේ

අඳුන් තිත් කැ ටියා
දුටු සත වඩන අ ටියා
ගත හුරු බුහු ටියා
ඇවිත් සබයට පැනපි කො ටියා

කොටි නැටුම, මුල දී කෝලම් ගණයේ ලා සැලකුන ද, දැන් එය ගැමි නැටුමක් වී ඇත්තේ, එහි ආදිය නො සැලකීමෙන් විය හැක.

මෙ සේ බලන කල කෝලම් ලෙස මැවී, නැටුමේ ස්වර්ණ මන්දිරය තුළ, පොෂණය වූ යේ අබලදුබල බව, විකල විකට බව, විදෙශික විජාතික බව අසරණ සසරණ බව, ලක්ෂණ අවලක්ෂණ බව, මිනිස් නොමිනිස් බව, අනුව යමින් නොව, සමාජයෙහි එවක කැපී පෙණුන විශෙෂතා අනුව යමින් බව පැහැදිලිය. නොහොත් මොන ලෙසක හෝ සමාජයේ තැන්ගෙන කලා ඇස දිනුවනුම කෝලම් නැටුමට පිටුනලවූ බව පැහැදිලිය.

මෙ වැනි වූ අතීත පුවත්, කෝලම නම් වූ නැටුම තුළ සැහ වී, එහි බලකාර ව පණගැනී, සිටින සැටි, සලකන විට, කෝලම පුරාණය රකින, අතීත විත්ති කියන, සිහිවටනයකියි ගැණුම වරද නැත.